සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය<br>இரண்டாம் தவணைப் பரீட்சை 2021<br>Second Term Test 2021 | 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 |
| කතෝලික ධර්මය | පැය 3 යි<br>3 மணி<br>3 hour |

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. පුරාණ ගිවිසුමට අයත් ඉතිහාස පොතකි.
   (1) ජොවෙල් (2) නෙහෙමියා (3) හග්ගායි (4) ඔබදියා

2. ශු. පාවුල් තුමා විසින්ම ලියන ලද සංදේශ සංඛ්‍යාව
   (1) 05 කි (2) 6 කි (3) 7 කි (4) 8 කි

3. ප්‍රඥා සාහිත්‍යයට අයත් පොත් කාණ්ඩය නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ,
   (1) ගීතාවලිය, ප්‍රේම ගී. ධර්මදේශකයා, ජෝබ්
   (2) හිතෝපදේශය, ප්‍රඥාව, උපදේශකයා, නික්මයාම
   (3) ගීතාවලිය, ජෝබ්, වීරාවලිය, සිරාක්
   (4) ප්‍රේම ගී. හිතෝපදේශය, ගණාන් කථාව, සිරාක්

4. මුල් කිතුණු සභාවේ ලක්ෂණයක් නොවන්නේ,
   (1) ඉගැන්වීම (2) සහභාගීකම (3) යාච්ඤාව (4) රෝගීන් සුව කිරීම

5. ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප්තුමා ශු. සභාවේ කී වෙනි දෘෂ්‍යමාන නායකයා ද?
   (1) 262 (2) 264 (3) 266 (4) 268

6. පෘතුග්‍රීසි පාලන සමයේ මෙරටට පැමිණි ධර්මදූත නිකායකි
   (1) නිර්මල මරිය නිකාය (2) බෙනදිකාන නිකාය
   (3) ද ලාසාල් පැවිදි නිකාය (4) දොමිනිකාන නිකාය

7. “ජීවනදායක භෝජනය මම ය, මා වෙත පැමිණෙන යමෙක් වේද ඔහුට සාගිනි නොවන්නේය” මෙම පාඨය සඳහන් වන්නේ,
   (1) ලූක් සුවිශේෂයේය (2) ජොහාන් සුවිශේෂයේය
   (3) ගලාති ලිපියේය (4) කොරෙන්ති ලිපියේය

8. “මේ දිනය නුඹලාට අනුස්මරණ දිනයක් ද මා හට මංගලෝත්සව දිනයක් ද ලෙස පැවැත්විය යුතුය.” මේ මංගල දිනය වන්නේ,
   (1) පාස්කු මංගල්‍යය (2) පෙන්තකොස්ත මංගල්‍යය
   (3) කූඩාරම් මංගල්‍යය (4) නැඹුල් ඵල මංගල්‍යය

9. පුරාණ ගිවිසුමේ යාග පූජා අතර වඩා වැදගත් තැනක් හිමි වූයේ,
   (1) නොදවන පූජාවන්ට (2) සාම පූජාවන්ටය
   (3) සත්ත්ව පූජාවන්ට (4) නැඹුල් ඵල පූජාවන්ට

10. වීර සෙබලා සඟරාව එළි දක්වන ලද්දේ,
   (1) මයිකල් රොද්‍රිගෝ පියතුමා (2) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
   (3) මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමාය (4) දෙවන ජුවාම් පාවුල් පාප් තුමා

11. පළමු පනතට විරුද්ධව සිදු කරන පාපයකි
(1) එදිනෙදා සිදුවීම් වලදී දෙවියන්ට දොස් කීම (2) කිතුනුවෙකු ලෙස කිතුනුකමට සාක්ෂි නොදැරීම
(3) වස්තු තන්හාවෙන් ව්‍යාපාර කටයුතු වල නියැලීම (4) විවාහ මංගල්‍යය වලදී පොරොන්දම් බැලීම

12. පියතුමෙකු ............... නැමති පාපයට සමාව දීම සඳහා රදගුරුතුමෙකුගෙන් විශේෂ අවසරයක් ගත යුතුය.
(1) මිනී මැරුම් (2) සිය දිවි හානි කර ගැනීමට තැත් කිරීම
(3) ගබ්සා කිරිම (4) ළමා අපචාර කිරීම

13. "මරණයකට පත් වුනත් මම මාගේ දේව ජීවිතය නැති කර නොගනිමි"මෙම ප්‍රකාශය කරන ලද්දේ,
(1) ශු. ජුසේ වාස් පියතුමාය (2) ශු. මරියගොරෙත්ති තුමිය
(3) ශු. මැක්සිමියන්ස් තුමාය (4) ශු. තෙරේසා මව්තුමිය

14. අනනියස් හා සපීරා ශුද්ධාත්මයාණන්ට විරුද්ධව කළ පාපය වන්නේ,
(1) අකීකරු වීම (2) සත්‍ය වසන් කිරීම
(3) කාමයේ වරදවා හැසිරීම (4) අයුක්ති සහගත වීම

15. "ලාඕස්" යන ග්‍රීක වචනයේ තේරුම වන්නේ
(1) ජනතාව (2) දේව වචනය
(3) ජන වන්දනාව (4) දිව්‍ය පූජාව

16. ශුද්ධාත්ම ආගමන මංගල්‍යය ජන වන්දනාව සඳහා භාවිතා වන වර්ණය වන්නේ,
(1) සුදු (2) කොළ (3) රතු (4) දම්

17. දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව වන්නේ,
(1) විශ්වාස ලක්ෂණය (2) ස්තෝත්‍ර යාගික යැදුම
(3) ස්වාමික් ආරාධනාව (4) විශ්වාසිකයින්ගේ යැදුම

18. දිව්‍ය පූජාවේදී දක්නට ලැබෙන "මුලසුනේ යැදුම්" ගණන
(1) දෙකකි (2) තුනකි (3) හතරකි (4) පහකි

19. උත්තම පූජක යාච්ඤාව සඳහන් වන්නේ,
(1) මතෙව් සුවිශේෂයේ ය (2) මාක් සුවිශේෂයේ ය
(3) ලූක් සුවිශේෂයේ ය (4) ජොහාන් සුවිශේෂයේ ය

20. ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය ඉස්මතු කෙරෙන්නේ,
(1) මල් උයනේ යාච්ඤාවේදී ය (2) අන්තිම රාත්‍රී භෝජනයේදී ය
(3) පරීක්ෂාවලට මුහුණ දීමේ දීය (4) කුරුසයේ ජීවිත පූජාවේ දීය

21. කායින් සහ ආබෙල් සිද්ධිය ලියැවී ඇති සම්ප්‍රදාය වන්නේ,
(1) J (2) P (3) D (4) E

22. ද්විතීය නීති සම්ප්‍රදායේ දකිය හැකි ලක්ෂණයකි
(1) සිහින හා දර්ශන මඟින් අනාවරණය වේ
(2) දෙවියන් වහන්සේට යාවේ යනුවෙන් අමතයි
(3) භාෂා ශෛලිය අනුශාසනාත්මකය
(4) සබත් දිනයේ වැදගත්කම පෙන්වා දෙයි

23. ලේඛක දිවැසිවරයෙකි
(1) එලියා (2) නාතාන් (3) හුල්දා (4) නාහුම්

24. ශු. මාක් තුමා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A - ක්‍රිස්තුස් වහන්සේගේ අනුකම්පාසහගත බව ඉස්මතු කරයි
B - ස්නාවක ජොහාන් තුමාගේ දේශනයෙන් ආරම්භ වේ
C - පේදුරු තුමාගේ භාෂා පරිවර්තකයාය
D- ජොහාන් තුමාගේ සහෝදරයෙකි

(1) A හා C (2) B හා C (3) B හා D (4) A හා D

25. ප්‍රාග් ඉතිහාසයට අයත් නොවන සිද්ධියකි,
(1) ආදම් හා ඒව පාපයට වැටීම
(2) කායින් හා ආබෙල් සිද්ධිය
(3) ඊසාක්ව පූජා කිරීමට ගෙන යාම
(4) ජල ගැල්මෙන් ලෝකය විනාශ වීම

26. උප්පත්ති පොතට අනුව සර්පයා යනු,
(1) මරණයේ සංකේතයයි
(2) රුචිකත්වයේ සංකේතයයි
(3) අකීකරුකමේ සංකේතයයි
(4) ලෞකිකත්වයේ සංකේතයයි

27. තම ජනතාව කිරියෙන් පැණියෙන් ඉතිරෙන දේශයකට ගෙන යාමට ස්වාමීන් වහන්සේ තෝරා ගනු ලැබුවේ,
(1) ජෝශප්ව ය
(2) ඊසාක්ව ය
(3) ආබ්‍රහම්ව ය
(4) මෝසෙස්ව ය

28. ගැලවුම්කරුවෙකු එවන බව දෙවියන් වහන්සේ ප්‍රථමයෙන්ම පොරොන්දු වූයේ,
(1) ආදි මව් පියන්ටය
(2) ආබ්‍රහම් තුමාටය
(3) මොසෙස් තුමාටය
(4) දිවැසිවරුන්ටය

29. ස්නාවක ජොහාන්තුමා පොදු ජනතාවට ආරාධනා කළේ,
(1) මෙල්කිසදෙක්ගේ යාගය
(2) මන්නා භෝජනය
(3) නුමුහුන් පුප අනුභවය
(4) අන්තිම රාත්‍රී භෝජනය

30. නාසරෙත් නුවර ධර්ම ශාලාවේ දී ජේසු තුමා කියවන ලද්දේ,
(1) ජෙරමියා දිවැසිවර ග්‍රන්ථයෙන් පාඨයකි
(2) හොසියා දිවැසිවර ග්‍රන්ථයෙන් පාඨයකි
(3) යෙසායා දිවැසිවර ග්‍රන්ථයෙන් පාඨයකි
(4) එසකියෙල් දිවැසිවර ග්‍රන්ථයෙන් පාඨයකි

31. “යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය …………”
(1) ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය
(2) ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝය
(3) ඔවුහු තෘප්තිමත් වන්නෝය
(4) ඔවුහු සැනසීම ලබන්නෝය

32. සියළු ජාතීන් ශ්‍රාවකයන් කර බෞතීස්මය ලබා දීමට ජේසුස් වහන්සේ තම ගෝලයන්ට අණ දුන්නේ,
(1) අන්‍යරූප විලාශ වූ අවස්ථාවේය
(2) ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපන ලැබූ අවස්ථාවේය
(3) උත්ථානයෙන් පසු ගෝලයන්ට දර්ශනය වූ අවස්ථාවේය
(4) ස්වර්ගාරෝහණය වීමට සූදානම් ව සිටි අවස්ථාවේය

33. රෝගීන්ගේ දිව්‍යමය ආලේපන නැමති අපෝස්තලික ව්‍යවස්ථාව ලියන ලද්දේ,
(1) II වන ජුවාම් පාවුළු පාප්තුමාය
(2) xi වන පාවුළු පාප් තුමාය
(3) 23 වන ජුවාම් පාප්තුමාය
(4) ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ය

34. පූජකවර සක්‍රමේන්තුව දානය කරනු ලබන්නේ,
(1) ශු. තෛලය අපේක්ෂකයාගේ දෑතේ ආලේප කිරීමයි
(2) පූජක පළඳනා අපේක්ෂකයාට පැළඳවීමෙනි
(3) අපේක්ෂකයා මුනින් තලා වී සාන්තුවරයන්ට යැදීමෙනි
(4) අපේක්ෂකයාගේ හිස මත අත් තබා නියමිත වචන උච්චාරණයෙනි

35. මිනිසෙක් තම පියා ද මවද අතහැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ දෙදෙනා එක්කෙනෙක් වන්නෝය. මෙම පාඨය සඳහන් වන්නේ.
(1) කොරෙන්ති ලිපියේය
(2) ගලාති ලිපියේය
(3) එපීස ලිපියේය
(4) රෝම ලිපියේය

36. ආරණ්‍යවාසී තාපසයන් අතර පළමු වැන්නා වන්නේ,
(1) තිබීයස් හි පාවුළු තුමාය
(2) පාදුවාහි අන්තෝනි තුමාය
(3) අසීසියේ ප්‍රැන්සිස් තුමාය
(4) අන්තියෝකයේ සිරිල් තුමාය

37. පැවිදි ජීවිතයේ ලක්ෂණ අතරට අයත් නොවන්නේ,
(1) යාච්ඤාවේ ජීවිතය
(2) සේවයේ ජීවිතය
(3) සරල ජීවිතය
(4) සාංඝික ජීවිතය

38. දේව ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දැක්වීම සඳහා ස්ථාපිත කරන ලද ගිහි අපෝස්තලික සේවාවකි.
(1) මරිය හමුදාව
(2) දිව්‍ය හෘදයේ සමිතිය
(3) තරුණ ශිෂ්‍ය ව්‍යාපාරය
(4) වින්සෙන්ති පාවුලා සමිතිය

39. ශාන්ති වින්සන් ද පාවුලා සමිතිය ආරම්භ කරන ලද්දේ,
(1) ලියෝ ජෝශප් කාදිනල් තුමා
(2) පෙඩ්රික් ඕසනම් පියතුමා
(3) ප්‍රැන්ක් ඩෆ් මහතා
(4) තෙරේසා මව් තුමිය

40. පැවිදි සොහොයුරන්ගේ නිකායකි
(1) ද ලාසාල් නිකාය
(2) නිර්මල මරිය නිකාය
(3) බෙනදිකාන නිකාය
(4) ජේසු නිකාය

(ලකුණු 40)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) 1. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ 02 ක් නම් කරන්න.
2. ශු. පාවුළු තුමා සමඟ ධර්ම දූත චාරිකා වලට සම්බන්ධ වූ පුද්ගලයන් 02 ක් නම් කරන්න.
3. ශු. දෙවන ජුවම් පාවුළු පාප් තුමාගේ ජීවිතයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න.
4. පොදු දේපළ පරිහරණය පිළිබඳ උගන්වන පනත් දෙක ලියන්න.
5. කිතුනු සභා එකමුතුව වෙනුවෙන් ගෙන ඇති පියවර 02 ක් සඳහන් කරන්න.
6. ඊශ්‍රායල් ජනතාව වර්ධනය වැලැක්වීමට මිසර රජතුමා ගත් පියවර 02 ක් ලියන්න.
7. ස්වභාවධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්යයන් දෙකකට උදාහරණ දෙන්න.
8. රෝගීන්ගේ ආලේපය ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද දෙකක් ලියන්න.
9. කිතුණු විවාහයේ පරමාර්ථ දෙක ලියන්න.
10. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ ආදර්ශ පාඨය ලියන්න. (ලකුණු 10 x 2= 20)

(02) 1. දිව්‍ය පූජාව තුළ දක්නට ලැබෙන ගෞරවයේ සංකේත 02 ක් ලියන්න.
2. පඬුරු පිදීමේ පරමාර්ථ තුනක් ලියන්න.
3. දිව්‍ය පූජාවට නිසි ලෙස සහභාගී වීමට ඔබ අනුගමනය කරන පියවර පැහැදිලි කරන්න.
(ලකුණු 2+3+5 = 10)

(03) 1. වපුරන්නාගේ උපමාවේ "සරු බිමේ වැඩුනු බීජ" සමාන කරන්නේ කුමකට ද?
2. දේවා රාජ්‍ය වටිනාකම පිළිබිඹු කරන සාරධර්ම තුනක් ලියන්න.
3. දේව රාජ්‍යය පතල කිරීම සඳහා ඔබ ක්‍රියා කරන අයුරු දක්වන්න.
(ලකුණු 2+3+5 = 10)

(04) 1. ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා වන බාහිර සලකුණු දෙකක් හා ඒවාහි අර්ථයන් ලියන්න.
2. ආත්මික මව් පියෙකු වීමට තිබිය යුතු සුදුසුකම් තුනක් ලියන්න.
3. ඔබ "ක්‍රිස්තු හේවා භටයෙකු" ලෙස ක්‍රියා කරන්නේ කෙසේද? පැහැදිලි කරන්න.
(ලකුණු 2+3+5 = 10)

(05) 1. පැවිදි පූජක පොරොන්දු දෙක නම් කරන්න.
2. තේවාචාරී වරයෙකුට පැවරෙන වගකීම් තුනක් ලියන්න.
3. පූජා ප්‍රසාදීන් වෙනුවෙන් ගිහි ඔබගේ යුතුකම් මොනවාද?
(ලකුණු 2+3+5 = 10)

(06) 1. මනස්ථාපන ආකාර දෙක කුමක් ද?
2. මනස්ථාපනය විය හැකි ක්‍රම තුනක් දක්වන්න.
3. සමගි සන්ධානයේ සක්‍රමේන්තුව ලබා ගැනීමට මැලි වන ඔබේ මිතුරෙකුට එහි වටිනාකම ඔබ පහදා දෙන ආකාරය ලියන්න.
(ලකුණු 5 x 2 = 10)

(07) මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
1. කල්වාරි යාගය
2. සිනයි ගිවිසුම
3. ප්‍රාතිහාර්ය (ලකුණු 5 x 2 = 10)